ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கைச் சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Act No.13 of 1957
Reg.by Boy Scout International Bureau on -22.02.1953

චක්‍රලේඛන අංක 38/2026

05/05/2026
සියලුම දිසා කොමසාරිස් වරුන් මගින්,
සියලුම සහය දිසා කොමසාරිස් (සිහිති) වෙත

## 3 වන ජාතික කිඩෝරිය 2026

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ සිහිති බාලදක්ෂ අංශය විසින් තෙවන වරටත් සංවිධානය කරනු ලබන 3 වන ජාතික කිඩෝරිය **2026 සැප්තැම්බර් මස 12, වන සෙනසුරාදා දින හා 13 වන ඉරු දින** යන දෙදින තුළ **මහනුවර බෝගම්බර ක්‍රීඩා පිටියේ දී** පැවැත්වීමට කටයුතු සූදානම් කරමින් පවතින බව සතුටින් දන්වමු.

3 වන ජාතික කිඩෝරිය සඳහා බාලදක්ෂ දිස්ත්‍රික්ක 37 හි පාසල් වල දැනට 1 හා 2 ශ්‍රේණි වල ඉගෙනුම ලබන සිහිති බාලදක්ෂ දරු දැරියන් එක්කර ගැනීමට අපි බලාපොරොත්තු වෙමු. වැඩ සටහන දෙදින තුල ම **පෙ.ව 8.30 ට ආරම්භ වී ප.ව 1.00 දක්වා** පැවැත්වෙන අතර සිහිති බාලදක්ෂයන්ට උත්සවය වඩාත් මතකයේ රැඳෙන පරිදි විවිධ වැඩසටහන් දැනටමත් සැලසුම් කර ඇත.

ලියාපදිංචි වන ළමුන් හා නායක නායිකාවන් සඳහා ලියාපදිංචි ගාස්තුව එක් අයෙකුගෙන් රුපියල් **500/-** කි. 3 වන ජාතික කිඩෝරියේ ලියාපදිංචි මුළු මුදලම එකවර මහජන බැංකු මූලස්ථාන ශාඛාවේ ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ ගිණුම් අංක **204100150085323** ට බැර කර එම රිසිට්පතෙහි මුල් පිටපතේ දිසාව සඳහන් කර ජාතික බාලදක්ෂ මූලස්ථානයේ slscout3@yahoo.com යන ඊමේල් ලිපිනයට විද්‍යුත් තැපැලෙන් **2026 ජූලි 15** වන දිනට පෙර එවිය යුතු ය.

සිහිති බාලදක්ෂ අංශය උසස් මට්ටමින් පවත්වාගෙන යාම සඳහා ඔබ සැමගේ දායකත්වය ගෞරවයෙන් අපේක්ෂා කරමු.

මේ පිළිබඳ ඔබගෙන් ලැබෙන සහය අගය කොට සලකමු.

ස්තුතියි,
මෙයට,
බාලදක්ෂ සේවයේ නියුතු,

*චන්ද්‍රාණි ප්‍රනාන්දු*
සහය ප්‍රධාන කොමසාරිස්
(පෝතක හා බාලදක්ෂ බාලිකා)
කිඩෝරි ප්‍රධාන සංවිධායක

*කේ.එම්.සී.එන්.කේ. කුලසේකර*
සහය ප්‍රධාන කොමසාරි (සිහිති)

*නීතීඥ. මනෝජ් නානායක්කාර*
ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්

**පිටපත් -**
ජාතික මූලස්ථානයේ සියළුම කොමසාරිස්වරුන් (දැ.ගැ.පි)
ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ සභාපති, විධායක කමිටු සභාපති, ගරු ලේකම් හා ගරු භාණ්ඩාගාරික
3 වන ජාතික කිඩෝරි ලිපිගොනුවට


ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,කොළඹ 02, ශ්‍රී ලංකා
சர். சிற்றம்பலம் ஏ. கார்டினர் மாவத்தை,கொழும்பு 02. இலங்கை.
Sir Chittampalam A Gardiner Mawatha,Colombo 02,Sri Lanka
Tel : +94 11 2 433 131/+94 11 5 231512
Fax : +94 11 2 433 131
E-mail: slsaheadq@gmail.com
Web : www.scout.lk